# ශ්‍රී ලංකාවේ ගොඩබිම වෙසෙන විෂ සහිත සර්පයින්

Fauna of Sri Lanka
SLWCS Poster Series
*Poster No. 03*

කුල 12කට සහ ගණ 49කට අයත්වන සර්ප විශේෂ 103ක් ශ්‍රී ලංකාවෙන් වාර්තා වේ. මොවුන් අතුරින් විශේෂ 15ක් සමුද්‍රවාසීන් වන අතර, ඉතිරි විශේෂ 88 අතුරින් අවශිෂ්ට විශේෂ (Relict species) 10ක්ද ඇතුළුව, විශේෂ 48ක් මෙරටට ආවේණික වේ. මීට අමතරව වෙනත් ගොඩබිම වෙසෙන (භෞමිය) සර්පයින් විශේෂ 08ක් උප විශේෂ මට්ටමින් මෙරටට ආවේණික වේ.

මෙරට හමුවන සර්පයින් අතුරින් විශේෂ 38කට පමණක් විෂ නිපදවන ග්‍රන්ථි (සත්‍ය විෂ ග්‍රන්ථි [True venom glands] හෝ ඩුවනෝයි ග්‍රන්ථි [Duvernoy's glands]) සහ ඒවා ශරීරගත කළහැකි පද්ධති පිහිටයි. විෂ, මූලික වශයෙන් තම ගොදුරු අඩපණ කිරීමට හා ජීර්ණය කිරීමටත්, ද්විතියිකව තම ආත්මාරක්ෂාවටත් සර්පයින්ට උපකාරී වේ. විෂෙහි ප්‍රභලත්වය සහ බලපෑම් අනුව සර්පයින් උග්‍ර විෂ (Highly venomous), මද විෂ (Moderately venomous), සුළු විෂ (Mildly venomous) හා නිර්විෂ (Non venomous) ලෙස කොටස් හතරකට බෙදා දැක්විය හැක.

## උග්‍ර විෂ සහිත සර්පයින් Highly venomous snakes

උග්‍ර විෂැති සර්පයෙකුගේ දෂ්ඨකිරීමකදී නිසි ප්‍රතිකාර නොකලහොත් විෂ ශරීරගත වීමෙන් රෝගියා මරණයට පත්වීමේ අවදානමක් ඇත. ශ්‍රී ලංකාවේ මේවන විට වාර්තා වන සර්ප විශේෂ 103 අතුරින්, විශේෂ 20ක් උග්‍ර විෂ සහිත සර්පයින් ලෙස සැලකේ. මේ අතරට මුහුදු සර්පයින් විශේෂ 15ක් සහ තෙල් කරවලා, මුදු කරවලා, නයා, තිත් පොළඟා සහ වැලි පොළඟා යන භෞමීය සර්ප විශේෂ පහ අයත් වේ. නමුත් මෙරට සර්ප දෂ්ඨකිරීම් හේතුවෙන් සිදුවන මරණ වලින් 97%කට හේතුවන්නේ තෙල් කරවලා, නයා සහ තිත් පොළඟා පමණි. එසේම වැලි පොළඟා සහ මුහුදු නයින් විශේෂ කිහිපයකගේම දෂ්ඨන මෙරටින් වාර්තා වී තිබුණද, එමගින් මරණ සිදුවී නොමැත.


© Nuwan Bandara

Indian Cobra/ Spectacled Cobra *Naja naja*
නයා/ නාගයා
ව්‍යාප්තිය: A,B,C,D,E | තත්ත්වය: CITES-App.II


පැටවා


Common Indian Krait *Bungarus caeruleus*
තෙල් කරවලා/ හබරලා
ව්‍යාප්තිය: B,C,E


Sri Lankan Krait *Bungarus ceylonicus*
මුදු කරවලා/ හත් කරවලා/ දුණු කරවලා
ව්‍යාප්තිය: A,D | තත්ත්වය: ආවේණික/ IUCN-NT

### උග්‍ර විෂැති කරවලුන් සහ ඔවුන් අනුකරණය කරන නිර්විෂැති සර්පයින් වෙන්කර හඳුනා ගැනිම.
(මොවුන් සියල්ලන් සුදු හරස් පටි සහිත කළු පැහැ ශරීර සහිතය)




**සත්‍ය කරවලුන් (Kraits, *Bungarus* ගණය) [උග්‍ර විෂ]-** කුඩා හිස. දිලිසෙන ශරීරය සුමුදු කොරල සහිතය. ශරීරයේ ඉහළින්ම, කශේරුව දිගේ පිහිටි කොරල ශරීරය දෙපස පිහිටි කොරල වලට වඩා විශාලය, ෂඩාශ්‍රාකාරය (a). ශරීරයේ පිහිටි සුදු පටි දෙපස පහළට යන තෙක් නොබෙදී, පැහැදිලි මායිම් සහිතව පිහිටයි (b). උදරියව තනි සුදු පැහැ හෝ කළු හරස් පටි සහිතව සුදු පැහැ හෝ විය හැක. වලිගයේ උදරියව තනි කොරල පෙළකි.

**රදනකයින් හෙවත් කුණුමී කරවලුන් (Wolf snakes, *Lycodon* ගණය), මිගැට කරවලුන් (Bridal snakes, *Dryocalamus* ගණය) සහ දාර කරවලුන් (Sri Lanka Wolf snake, *Cercaspis* ගණය) [නිර්විෂ]-** සාපේක්ෂව විශාල හිස. රළු හෝ සුමුදු කොරල සහිත ශරීරය. ශරීරයේ ඉහළින්ම කශේරුව දිගේ පිහිටි කොරල, ශරීරය දෙපස පිහිටි කොරල වලට හැඩයෙන් සහ ප්‍රමාණයෙන් සමානය (c). ශරීරයේ පිහිටි සුදු පටි දෙපස පහළට යත්ම ඇතැම් විට බෙදී අපැහැදිලිව පිහිටයි (d). උදරියව තනි සුදු පැහැ වේ. වලිගයේ උදරියව කොරල පේළි එකක් හෝ දෙකක් පිහිටයි.




පැටවා

Russell's Viper *Daboia russelii*
තිත් පොළඟා
ව්‍යාප්තිය: A,B,C,D,E


Saw-scaled Viper *Echis carinatus*
වැලි පොළඟා
ව්‍යාප්තිය: B,E | තත්ත්වය: IUCN-VU/ CITES-App.II

### උග්‍ර විෂැති තිත් පොළඟුන් සහ ඔවුනට පැහැයෙන් සමාන නිර්විෂ පිඹුරු පැටවුන් වෙන්කර හඳුනා ගැනිම.




**තිත් පොළඟා (Russell's viper) [උග්‍ර විෂ]-** ශරීරය දිගට පැහැදිලි කළු දාර සහිත, එකිනෙකට යාවූ තද දුඹුරු පුල්ලි පේළි තුනක් (ඉහළින් සහ දෙපසින්), දම්වැලක ආකාරයට පිහිටයි. ත්‍රිකෝණාකාර හිස කුඩා කොරල රැසකින් ආවරණය වී ඇත. හිස මත සුදු පැහැති 'Λ' සලකුණකි.

**පිඹුරා (Rock python) [නිර්විෂ]-** ශරීරයේ දිගට නිශ්චිත හැඩයක් නොමැති, එකිනෙකට යා නොවූ තද පැහැ සළකුණු පිහිටයි (e). හිස පැහැදිලි ලෙස වෙන්වී පෙනෙන විශාල කොරල වලින් ආවරණය වී ඇත. හිස මත හෙල්ලක තුඩක් වැනි තද පැහැ සලකුණකි.

## සුළු විෂ සහිත සර්පයින් Mildly venomous snakes

**සුළු විෂැති සර්පයින් කිසිවකුගේ දෂ්ඨකිරීම් වලින් මරණ වාර්තා වී නැත.** නමුත් දෂ්ඨ කළ ස්ථානය අවට සුළු වේලාවක් හෝ ඉතා කලාතුරකින් සුළු කලක් පවතින ඉදිමීම, වේදනාව සහ තද පැහැවීම් පැවතිය හැක. මොවුනට සත්‍ය විෂ ග්‍රන්ථි නොමැති අතර ඩුවනෝයි ග්‍රන්ථියක් සහ උගුර ආසන්නයේ පිහිටි විකරණය වූ දළ වලින් සැදි නොදියුණු (ප්‍රාථමික) විෂ පද්ධති ක්‍රමයක් පිහිටයි. ශ්‍රී ලංකාවේ හමුවන සුළු විෂැති සර්පයින් සංඛ්‍යාව 12කි. මොවුන් කොලුබ්‍රිඩේ (Colubridae) නේට්‍රිසිඩේ (Natricidae) සහ හොමලොප්සිඩේ (Homalopsidae) යන කුලවලට අයත් වන අතර, විවිධ මිත්‍යාමත සහ වැරදි ආකල්ප හේතුවෙන් නිකරුනේ මරා දමයි.


Barnes's Cat Snake *Boiga barnesi*
පඳුරු මාපිලා
ව්‍යාප්තිය: A,D | තත්ත්වය: ආවේණික/ FFPA-Pr/ IUCN-NT


Common Indian Cat Snake *Boiga beddomei*
කහ මාපිලා
ව්‍යාප්තිය: A,B,C | තත්ත්වය: FFPA-Pr/ IUCN- DD


Sri Lankan Cat Snake *Boiga ceylonensis*
නිදි මාපිලා
ව්‍යාප්තිය: A,B,C,D,E | තත්ත්වය: FFPA-Pr


Forsten's Cat Snake *Boiga forsteni*
ලේ මාපිලා/ නාග මාපිලා
ව්‍යාප්තිය: A,B,C,E | තත්ත්වය: FFPA-Pr


Gamma Cat Snake *Boiga trigonata*
රැන් මාපිලා
ව්‍යාප්තිය: A,B,E | තත්ත්වය: FFPA-Pr


Sri Lankan Blossom Krait *Balanophis ceylonensis*
නිහලුවා/ මල් කරවලා
ව්‍යාප්තිය: A | තත්ත්වය: ආවේණික/ FFPA-Pr/ IUCN-VU


Green Vine Snake *Ahaetulla nasuta*
ඇහැටුල්ලා
ව්‍යාප්තිය: A,B,C,D,E | තත්ත්වය: FFPA-Pr


Brown Vine Snake *Ahaetulla pulverulenta*
හෙන කඳයා
ව්‍යාප්තිය: A,B,C | තත්ත්වය: FFPA-Pr/ IUCN-NT


© Nuwan Bandara

Ornate Flying Snake *Chrysopelea ornata*
මල්සරා/ පොල්මල් කරවලා
ව්‍යාප්තිය: A,B,C | තත්ත්වය: FFPA-Pr/ IUCN-NT


Sri Lanka Flying Snake *Chrysopelea taprobanica*
දඟර දණ්ඩා
ව්‍යාප්තිය: B,C,E | තත්ත්වය: ආවේණික/ FFPA-Pr/ IUCN-VU


Dog-faced Water Snake *Cerberus rynchops*
කුණුදිය කළුවා
ව්‍යාප්තිය: කඩොලාන/ගංමෝය | තත්ත්වය: FFPA-Pr/ IUCN-VU


© Kedar Bhide

Gerad's Water Snake *Gerada provestiana*
ප්‍රෙවොස්ට්ගේ දියබරියා
ව්‍යාප්තිය: කඩොලාන/ගංමෝය | තත්ත්වය: FFPA-Pr/ IUCN-CR

## මද විෂ සහිත සර්පයින් Moderately venomous snakes

මද විෂැති සර්පයින්ගේ දෂ්ඨකිරීම් වලින් ශරීර අවයවවලට (උදා- වකුගඩු) ආබාධ ඇතිවිය හැක. මෙරට හමුවන මද විෂ සහිත සර්ප විශේෂ වන කුණකටුවන් හෙවත් පොළොං තෙලිස්සන් (Hump-nosed Pit Vipers, *Hypnale* species), පලා පොළඟා සහ දෙපත් කළුවා යන විශේෂ සියල්ලගෙන්ම දෂ්ඨකිරීම් වාර්තා වී තිබුණද, ඒ අතුරින් මිනිස් මරණයකට හේතුවී ඇත්තේ කුණකටුවන්ගේ දෂ්ඨන ඉතා සුළු ප්‍රමාණයක් පමණි. බඩ රතු දෙපත් කළුවාගේ දෂ්ඨන වාර්තා වී නොතිබුනද, ඔහු අයත් ගණයේ (*Calliophis*) ලක්ෂණ සැළකීමෙන් අදාළ විශේෂය මෙම කාණ්ඩයට ඇතුලත් කර ඇත.


Hump-nosed Vipers *Hypnale* spp.
කුණ කටුවා/ තෙලිස්සා
ව්‍යාප්තිය: A,B,C,D,E | තත්ත්වය: FFPA-Pr


Green pit viper *Trimeresurus trigonocephalus*
පලා පොළඟා
ව්‍යාප්තිය: A,B,C,D | තත්ත්වය: ආවේණික/ FFPA-Pr


Sri Lanka Coralsnake *Calliophis melanurus*
දෙපත් කළුවා
ව්‍යාප්තිය: B,C,E | තත්ත්වය: FFPA-Pr/ IUCN-NT


© WHT

Blood-bellied Coralsnake *Calliophis haematoetron*
බඩ රතු දෙපත් කළුවා
ව්‍යාප්තිය: C | තත්ත්වය: ආවේණික/ FFPA-Pr

## සර්ප දෂ්ඨනයක් සිදුවුවහොත්....

- රෝගියා කලබල වීම වළක්වා ඔහුගේ බිය දුරු කරන්න. දෂ්ඨනය සිදුවූ ස්ථානය කපා විෂ උරා ඉවත් කිරීමට කිසිවිටෙක තැත් නොකරන්න.
- ශරීරයේ දෂ්ඨකිරීම වූ ස්ථානය සහ ඒ අවට සබන් යොදා පිරිසිදු ජලයෙන් සෝදා, පිරිසිදු රෙදි කඩකින් වසන්න. තුවාලයට ඉහළින් තදවන සේ තිරිංග බැඳීම නොකරන්න. එමගින් අදාළ ගාත්‍රයේ රුධිර සංසරණය නතර වන බැවින් වැරදි ආකාරයට බඳින ලද තිරිංගයකින් යහපතකට වඩා අයහපතක් සිදු වේ.
- රෝගියාට හොඳින් සිහිය තිබේනම්, වේදනාව පවතිනම් සහ දෂ්ඨනය සිදුකළේ කරවලෙකු නොවේ නම් පමණක් පැරසිටමෝල් පෙති 2ක් දෙන්න. සිහිය නැතිනම් කිසිවක් පානය කරවීමට තැත් නොකරන්න. ඇස්ප්‍රින් (ඇස්ප්‍රින් සංයෝගවල ලේ කැටි ගැසීම වළක්වන ගුණයක් ඇති බැවින් රක්තපාතය වැඩි විය හැක), මත්පැන් (විෂ අවශෝෂණය ඉක්මන් කරවයි) හෝ පොටැසියම් ලවණ බහුල වශයෙන් ඇති කුරුම්බා හා පළතුරු යුෂ වැනි දෑ (වකුගඩු වලට විය හැකි හානි තවදුරටත් වැඩි විය හැක) කිසිවක් රෝගියාට නොදෙන්න.
- දෂ්ඨනය සිදුවූ ගාත්‍රය ඉදිමිය හැකි බැවින්, එහි පැළඳ සිටින ආභරණ ගලවන්න.
- රෝගියා වෙහෙස නොවෙන පරිද්ද (වාහනයකින් හෝ ඔසවාගෙන), දෂ්ඨකිරීම සිදුවූ ගාත්‍රය නොසෙල්වෙන පරිද්ද, රෝගියා වහා ළඟම පිහිටි රජයේ රෝහලක් වෙත ගෙන යන්න. කිසිවිටෙක අත් බෙහෙත් හෝ ගොඩ වෙදකම් නොකරන්න.

සර්ප දෂ්ඨනයකට ප්‍රතිකාර කිරීමට, දෂ්ඨනය සිදුකළ සර්ප විශේෂය හඳුනා ගැනිම අත්‍යාවශ්‍ය නොවන අතර, අවශ්‍ය වුවහොත් ඒ සඳහා විවිධ වෛද්‍ය විද්‍යාත්මක ක්‍රමවේද ඇත. එබැවින් දෂ්ඨ කළ සර්පයා මරා හෝ නොමරා රැගෙන යාම කිසිසේත්ම අවශ්‍ය නොවේ. එය කිරීමට යාම තවත් දෂ්ඨකිරීම් සිදුවීමට හේතුවියද හැක. එසේම නිරපරාදේ සර්පයින් මරා දැමීමටද මෙය හේතු වේ.




### ශ්‍රී ලංකාවේ ගොඩබිම වෙසෙන විෂ සහිත සර්පයින්ගේ ව්‍යාප්තිය.

- A - තෙත් කලාපය
- B - වියළි කලාපය
- C - අතරමැදි කලාපය
- D - මධ්‍යම කඳුකරය
- E - අර්ධ ශුෂ්ක කලාපය

තත්ත්වය
ආවේණික : Endemic
IUCN : 2007 ශ්‍රී ලංකා රතු දත්ත වාර්තාවට අනුව සංරක්ෂණ තත්ත්වය
- CR- Critically Endangered දැඩිලෙස අන්තරායට ලක්වූ
- VU- Vulnerable අවදානමට ලක්විය හැකි
- NT- Near Threatened ඉදිරියේදී තර්ජනයට ලක්විය හැකි
- DD- Data deficient දත්ත හිඟ

FFPO-Pr : ශ්‍රී ලංකා වනසත්ව හා තුරුලතා ආරක්ෂක ආඥාපනත යටතේ නීතියෙන් ආරක්ෂිත
CITES : තර්ජනයට ලක්වූ ජීවීන්ගේ අන්තර්ජාතික වෙළඳාම සඳහා වන සම්මුතියේ ඇතුලත්

### මතක තබා ගන්න

1. සර්ප විශේෂ සියල්ලම විෂ සහිත නොවන අතර ඔවුන් සියළු දෙනාම දෂ්ඨන සිදු නොකරයි.
2. දෂ්ඨන සිදුකරන සෑම සර්පයෙකුම විෂ සහිත නොවන අතර විෂ සහිත සර්පයෙකුගේ දෂ්ඨනයකදී වුවද සෑම විටම විෂ ශරීරගත සිදුනොවේ.
3. විෂ ශරීරගත වුවද, ඒ සඳහා සාර්ථක ප්‍රතිකාර ඇති බැවින් ඔබ නොපමාව සහ බුද්ධිමත්ව ක්‍රියාකළහොත් කිසිදු ජිවිත අනතුරක් සිදුනොවේ.

## සර්පයින්ගේ වැදගත්කම

සර්පයින් දෂ්ඨ කරනුයේ උන්ගේ ආත්මාරක්ෂාවට මිස, මිනිසුන් විනාශ කිරීමට නොවේ. පරිසරයේ සමතුලිතබව පවත්වා ගැනිමෙන් පරිසර විද්‍යාත්මකවද, මෙරට කෘෂිකර්මාන්තයේ ප්‍රධානතම පළිබෝධකයින් කොටසක් වන මීයන් පාලනය කිරීමෙන් ආර්ථිකවද, කම්මුල්ගාය, රක්තවාතය, මහාමාරිය, කොලරාව ඇතුළු රෝග රැසකට ප්‍රතිකාර මෙන්ම වේදනානාශක, ප්‍රතිකැටිකාරක සහ එන්සයිම ලෙස සර්ප විෂ යොදාගැනීමෙන් වෛද්‍ය විද්‍යාත්මකවද සර්පයින් මිනිසාට ඉමහත් වැදගත්කමක් දරයි. එලෙසම සර්ප දෂ්ඨනයන්ට ප්‍රතිකාර වශයෙන් යොදාගැනෙන ප්‍රතිවිෂ එන්නත් නිපදවනුයේද, සර්ප විෂ යොදාගෙනය. එබැවින් දුටු තැන සියළු සර්පයින් නිකරුනේ මරා නොදමා, අනතුරුදායක සර්පයින් හඳුනාගැනිමටත්, ඔවුන්ගේ දෂ්ඨනවලින් වැලකී සිටීමටත්, සර්පයින් ඇතුළු සියළු සතුන් සංරක්ෂණයට දායක විමටත් පුරුදු වන්න.

*අදහස සහ නිර්මාණය*

**රුචිර සෝමවීර, නුවන් බණ්ඩාර,**
**නිලූෂා සෝමවීර සහ නයන විජේතිලක**
සත්ත්ව විද්‍යා දෙපර්තුමේන්තුව, විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, පේරාදෙණිය.

(අයිතිය දක්වා නොමැති සියළු ජායාරූප රුචිර සෝමවීර විසිනි)

**Sri Lanka Wildlife Conservation Society**
**ශ්‍රී ලංකා වනජීවී සංරක්ෂණ සංගමය**
**இலங்கைவனவிலங்கு பாதுகாப்பு சங்கம்**

www.SLWCS.org / info@slwcs.org / (011) 2714710
38, අර්බන් පෙදෙස, දෙහිවල.

අදහස සහ නිර්මාණය සඳහා හිමිකම් © 2011: රුචිර සෝමවීර, නුවන් බණ්ඩාර, නිලූෂා සෝමවීර සහ නයන විජේතිලක. ජායාරූප සඳහා හිමිකම් © 2011: දක්වා ඇති පරිදි. ප්‍රකාශනය සඳහා හිමිකම් © 2011: ශ්‍රී ලංකා වනජීවී සංරක්ෂණ සංගමය. මෙම ප්‍රකාශනයේ අඩංගු කරුණු සහ/හෝ ජායාරූප, අධ්‍යාපනික සහ වාණිජ නොවන වෙනත් කටයුතු සඳහා ඉහත හිමිකම් දරණ අයගෙන් ලිඛිත අවසරයකින් තොරව, අදාළ මූලාශ්‍රය නිවැරදිව දක්වමින් උපුටාගත හැක. මෙම ප්‍රකාශනයේ අඩංගු කරුණු සහ/හෝ ජායාරූප වාණිජමය කටයුත්තක් සඳහා යොදා ගන්නේනම්, ඒ සඳහා ඉහත හිමිකම් දරණ අයගෙන් ලිඛිත අවසරයක් අවශ්‍ය වේ.

විශේෂ ස්තුතිය රවී කොරයා, චන්දිප් කොරයා, සුමින්ද මුණිදාස, කෙඩාර් බහිඩ්, ශ්‍රී ලංකා වනජිවී උරුම භාරය සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලීය සත්ත්වවේදීන්ගේ සංගමයේ සාමාජිකයින් හට.

මුද්‍රණය: 2011